## බී.එම්.එස්.කේ.බාලසූරිය එ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- මහවැව

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/1270/19 (2019.09.03 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල

**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන

**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** : ඩී. ජී. ඒම්. වී. හපුආරච්චි

**අභියාචක** - බී.එම්.එස්.කේ.බාලසූරිය

**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි - ප්‍රාදේශිය ලෙකම් කාර්යාලය- මහවැව

**පෙනීසිටීම**

අභියාචක - පැමිණ ඇත.

පොදු අධිකාරිය - ඩබ්ලිව්. ඒ. ආර්.වික්‍රමනායක-සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)

පී.එච්.ඩබ්ලිව්. ඒකනායක -නම්කළනිලධාරි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018-06-07 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | නැත |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018-09-20 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018-10-11 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019-02-20 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018-06-07 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

(1) 2015 වසරේ ගම 15000ක් නගා සිටුවීමේ වැඩසටහන යටතේ පහල කුඩා වැව පුෂ්පාරාම විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම අභියාචක විසින් සිදු කරන ලද අතර ව්‍යාපෘතිය අවසාන වී ඇතත් රඳවා ගත් මුදල් සහ අතිරේක වැඩ සඳහා වූ මුදල් මෙතෙක් නිදහස් කර නොමැති අතර ඒ සම්බන්දයෙන් මහවැව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් අභියාචක විසින් සිදු කල විමසිමක දී අදාල ඉදිකිරීම සම්බන්දයෙන් මහා වැව ප්‍රාදේශීය ලේකම කාර්යාලයෙන් පවසා සිටියේ මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීන් විසින් තාක්ෂණ වාර්තාවක් ලබා දී ඇති බවයි.ඒ අනුව, එම තාක්ෂණ වාර්තාවේ සහතික කරන ලද පිටපතක්

(2) 2016/5/9 වන දින මෙත්තා වැඩිහිටි සමිතියේ ලේකම් වෙත ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලය විසින් එවන ලද ලිපියෙන් දැක්වුයේ කාර්මික නිලධාරිතුමියගේ උපදෙස් ලබා ගෙන අවශ්‍ය පිළිසකර කිරීම් සිදු කරන ලෙසයි. ඒ අනුව ක්‍රියාත්මක වෙමින් මෙත්තා වැඩිහිටි සමිතිය 2016/5/11 වන නිලධාරිතුමිය මගින් ලිඛිතව යොමු කරන ලෙසයි.ඒ අනුව,එම ලිපිය සම්බධයෙන් පොදු අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග ඇතුළත් ලිපි ලේඛන වල සහතික පිටපත්

(3) ඉහත 2 හි සඳහන් මෙත්තා වැඩිහිටි සමිතිය විසින් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලද ලිපියේ ඉල්ලූ උපදෙස් මෙත්තා වැඩිහිටි සමිතිය වෙත ලබාදීමට අපොහොසහත් වීමට හේතු

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසහත් වූ බැවින් අභියාචක 2018-09-20 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී.  නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වුවද  මෙම ප්‍රතිචාරයෙන් අභියාචක අතෘප්තියට පත් වූ බැවින් අභියාචක 2019-02-20 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

දෙපාර්ශවයම කොමිෂන් සභාව වෙත පැමිණ ඇති බව නිරීක්ෂණය කළ හැක.

පොදු අධිකාරිය විසින් 2019-08-31 වන දින කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ සඳහන් වන්නේ අභියාචක විසින් අයදුම් කර තිබෙන තොරතුරු වන අභියාචක විසින් සිදු කරන ලද පහල කුඩා වැව පුෂ්පාරාම විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම සම්බන්ධයෙන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරීන් විසින් ලබා දී තිබූ තාක්ෂණ වාර්තාවක් අභියචකට  ලබා දීමේ හැකියවක් නොතිබුණි බවයි. එයට හේතුව ලෙස පොදු අධිකාරිය දක්වන ලැබුවේ අභියාචක මෙත්තා වැඩිහිටි සමිතියේ සාමාජිකයෙක් නොවන බවයි.

**නියෝගය**

පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කළ තර්කය පිලිගත නොහැකි බවින් කොමිෂන් සභාව නියෝග කරනු  ලැබුයේ පනතේ 5 වන වගන්තිය යටතේ වන අවස්ථා වලදී හැර අනිකුත් අවස්ථා වලදී  පොදු අධිකාරියට තොරතුරු ලබාදීම ප්රතික්ෂේප කල නොහැකි බවය. තවද ඕනෑම පුරවැසියකු හට මෙම පනත යටතේ ඕනෑම පොදු අධිකාරියකින් තොරතුරු ඉල්ලීමක් කිරීමට හැකියාවක් පවතින බවත්ය.

එ අනුව කොමිෂන් සභාව පොදු අධිකාරිය වෙත නියෝග කරනු තාක්ෂණ වාර්තාව මීළඟ නඩු විභාග දිනයේදී කොමිසම ට ඉදිරිපත් කරන ලෙසය.

ඒ අනුව මීළඟ අභියාචනා විභාගය 2019.10.15 දිනට කල්තබනු ලැබේ.

*****

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/1270/19 (2019.10.15 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල

**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන

**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**පෙනීසිටීම**

අභියාචක - පැමිණ ඇත.

පොදු අධිකාරිය - ඩබ්ලිව්. ඒ. ආර්.වික්‍රමනායක-සහකාර අධ්‍යක්ෂක (සැලසුම්)

පී.එච්.ඩබ්ලිව්. ඒකනායක -නම්කළ නිලධාරි

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

දෙපාර්ශවයම පැමිණ සිටින බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

2019-10-09 දින පොදු අධිකාරියේහි නම් කල නිලධාරි විසින් කොමිෂන් සභාවටද පිටපතක් සහිතව අභියාචක වෙත අදාළ තාක්ෂණ වාර්තාව ඉදිරිපත් කර ඇත.

අභියාචක විසින් 2019-10-11 වන දිනැතිව පොදු අධිකාරියෙහි නම් කල නිලධාරි වෙත ලිපියක් යොමු කරමින් දන්වා සිටිනුයේ 2019-10-09 වන දින පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණ වාර්තාව ප්‍රතික්ෂේප කරන බවත් තාක්ෂණ වාර්තාවක් යනු සිදුවීම් පිළිබඳ වාර්තාවක් නොවන බවත් එම වාර්තාවේ අඩංගු වී යුත්තේ ප්‍රතිසංස්කරණ කිරීමේ ක්‍රමවේදය බවත් ය.

අභියාචක විසින් 2019-10-11 වන දිනැති ලිපියට ප්‍රතිචාරයක් වශයෙන් පොදු අධිකාරියෙහි නම් කල නිලධාරි විසින් පහල කුඩා වැව පුෂ්පාරාම විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සම්බන්ධයෙන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද වාර්තව ද කොමිෂන් සභාවටද පිටපතක් සහිතව ඉදිරිපත් කර ඇත.

අභියාචක විසින් 2019-10-11 වන දිනැතිව ඉදිරිපත් කරන ලද තාක්ෂණ වාර්තාව සහ 2019- 10-11 දිනැතිව පොදු අධිකාරියෙහි කාර්මික නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් අභියාචක සෑහීමකට පත් නොවන බවත් එකී වාර්තා පිළි ගැනීම ප්‍රතික්ෂේප කර සිටී.

**නියෝගය**

දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද එකී තාක්ෂණ වාර්තාව කොමිෂන් සභාව විසින් අධ්‍යනය කොට ඒ සම්බන්ධව අවසන් තීරණයක් ලබා දෙනු ඇත.

ඒ අනුව මීළඟ අභියාචනා විභාගය 2020.01.14 දිනට කල්තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.